**බුලත්සිංහල ප්‍රාදේශීය සභාව**

**------------------------------**

**කළුතර දිස්ත්‍රික්කය**

**------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබද විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020සැප්තැම්බර් 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂයේ පුස්තකාල පොත් සමීක්ෂණයෙන් හඳුනාගත් රු.117,148 ක් වූ අස්ථානගත පොත් වල අගය මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුයි. | පුස්තකාල පොත් සමීක්ෂණයේ පසු කටයුතු අවසාන විමෙන් පසු 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් ගැලපීමට කටයුතු කරමි. |
| (ii) | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගෙන විකුණන ලද හා ඉවත් කල අයිතමයන් 78 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සභාව සතු ඉඩම් 08 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කල යුතුයි. | සභාව සතු සියළුම ඉඩම් වටිනාකම හඳුනාගැනීමෙන් අනතුරුව 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | දීර්ඝ කාලයක සිට පැවත එන රු.43,859 ක් වු ලැබිය යුතු අත්තිකාරම් ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂයේ වැය ගිණුම් වලට ගලපා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කරමි. |
| (v) | පෞද්ගලික පෙර පාසැල් වෙනුවෙන් ලබාදී තිබු රු.383,270 ක් වු භාණ්ඩ සහා වත්කම් ලෙස මූලා ප්‍රකාශනවල ඇතුලත් කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කරමි. |

(ආ) අවිනිශ්චිත ගිණුම

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවිනිශ්චිත ගිණුමේ පැවති රු.116,297 ක් වු බැර ශේෂය නිවැරදිව හඳුනා නොගෙන සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | අවිනිශ්චිත ගිණුමේ ඇති ශේෂයන් නිවරදිව හඳුනා ගැනීමෙන් පසු අදාල ගැලපීම් සිදු කල යුතුය. | සියළුම ගිණුම් ශේෂයන් උපලේඛන හා සැසඳි ඇති බැවින් මෙම මුදල හඳුනා ගත නොහැකි නිසා සමුච්චිතය හරහා නිරවුල් කර ඇති බව සඳහන් කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) වර්ෂ 03 ක කාල සීමාව ඉක්ම වූ කර්මාන්ත ණයගැති හා ණය හිමි ශේෂ පිළිවෙලින් රු.58,543 ක් හා රු.782,536 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරිමට කටයුතු කල යුතුය. | 2020 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| (ii)2015 සිට 2017 වර්ෂය දක්වා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.952,001 ක් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරිමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

---------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | ---------------------- | --------- | ----------- | ------------ | --------------------- |
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | | | |
| | (i) 21 වගන්තිය | | සභාව සතු සමස්ථ මාර්ග ප්‍රමාණය ග්‍රාම සේවා වසම් අනුව හදුනා ගැනීමක් සිදුකර නොතිබුණි. | සභාව සතු සමස්ථ මාර්ග ග්‍රාම සේවා වසම් අනුව හදුනාගත යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| | (ii) 134(1) වගන්තිය | | සභාව විසින් වරිපනම් බදු සඳහා නව හදුනාගැනීමක් සිදු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කල යුතුය. | ස්වාභාවික ආපදා වලට මුහුණ දෙන ප්‍රදේශයක් බැවින් ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව මේ දක්වා කටයුතු කර නොමැත. |
| | (iii) 143(1)වගන්තිය | | තක්සේරු කර ඇති දේපලක භෞතික වෙනසක් සිදු වූ විට තක්සේරුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කල යුතුය. | 2020 වසරේ ඉටු කිරිමට කටයුතු කරමි. |
| | (iv) 160 වගන්තිය | | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කල යුතුය. | 2020 වර්ෂයේදී හිඟ අය කර ගැනීමට අදාලව පනත අනුව කටයුතු කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කල යුතුය. | ඉදිරියේදී වර්ෂයක් පසා සමීක්ෂණ කටයුතු සිදු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,003,584 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,318,814 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,263,767 | 3,552,662 | 3,438,728 | 686,754 | 3,538,767 | 3,147,502 | 2,927,209 | 708,683 |
| (ii) | කුලි | 4,205,000 | 374,821 | 1,016,814 | 35,622 | 4,960,000 | - | 650,110 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 756,000 | 715,334 | 793,049 | 8,000 | 610,000 | 350.000 | 716,443 | - |
| (iv) | වෙනත් ආදායම් | 24,330,000 | - | 18,176,299 | - | 21,580,000 | - | 13,577,105 | - |
| | | 33,554,767 | 4,642,817 | 23,424,890 | 730,376 | 30,688,767 | 3,497,502 | 17,870,867 | 708,683 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

--------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයට අක්කර බදු හිඟය රු.71,868 ක් වූ අතර 2020 ජුනි 30 දිනට රු.14,638 ක් පමණක් අයකර තිබුණි. | හිඟ ආදායම අය කිරීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

(අ) උසාවි දඩ

-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟහිටි උසාවි දඩ මුදල | හිඟ ආදායම් කඩිනමින් අයකර | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |

රු.5,735,667 ක් වූ අතර සමාලෝචිත ගත යුතුය. වර්ෂය සඳහා රු.5,500,000 ක් බිල්කර තිබුණි. 2020 ජුනි 30 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.7,457,748 ක් විය.

(ආ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟහිටි මුද්දර ගාස්තු මුදල රු.12,689,345 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා රු.8,500,000 ක් බිල්කර තිබුණි. 2020 ජුනි 30 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.8,353,995 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේ අයවැය ලේඛනයේ මාර්ග සංවර්ධනය සඳහා සහා අරමුදල් යටතේ රු.2,200,000 ක ප්‍රතිපාදන ඇතුලත් කලද, එය ක්‍රියාකාරි සැලැස්ම තුල හඳුනාගෙන සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබීම නිසා වෙන් කල මුළු ප්‍රතිපාදනයම ඉතිරිව පැවතුණි. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව නිවැරදිව ක්‍රියාකාරි සැලැස්ම සකස් කල යුතුය. | ක්‍රියාකාරි සැලැස්ම තුල ඇතුලත් කල මාර්ග වලින් වැඩි කොටසක් බාහිර ප්‍රතිපාදන මත සංවර්ධන අරමුණු ඉටුකර ගෙන ඇත. |
| (ආ) බාහිර ප්‍රතිපාදන යටතේ ක්‍රියාකාරි සැලැස්ම තුල හඳුනාගෙන තිබුණු රු.මි.12.4 ක පිරිවැය වූ මාර්ග ව්‍යාපෘති 13 ක් 2019 වර්ෂය තුල ඉටු කර නොතිබුණු අතර ක්‍රියාකාරි සැලැස්මෙන් පරිබාහිරව , බාහිර ප්‍රතිපාදන යටතේ ලැබුණු රු.මි.19.36 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන ව්‍යාපෘති 24 ක් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර තිබුණි. | ක්‍රියාකාරි සැලැස්මට අනුගතව කටයුතු කල යුතුය. පරිභාහිරව කරනු ලබන කාර්යයන් වෙනුවෙන් අනුමැතීන් ලබාගත යුතුය. | බාහිර ව්‍යාපෘති වලින් වැඩි කොටසක් මේ වන විට සිදු කර අවසන් කර ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසමක් සඳහා එක් ප්‍රජා මණ්ඩලය බැගින් පිහිටුවිය යුතු වුවත් බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ග්‍රාම නිලධාරි වසම් 54 ක් සඳහා ප්‍රජා මණ්ඩල 21 ක් පමණක් පිහිටුවා ගැනීමට කටයුතු කර තිබුණි. | සභා බල ප්‍රදේශයේ සෑම ග්‍රාම නිලධාරි වසමක් වෙනුවෙන්ම ප්‍රජා මණ්ඩල පිහිටුවා ගත යුතුය. | ග්‍රාම නිලධාරි වසම් 21 ක් වෙනුවෙන් ප්‍රජා මණ්ඩල පිහිටුවා ඇත. |
| (ආ) ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ගිණුමේ පවතින රු.4,260,117 ක බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදි නිරවුල් කිරීමට කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| පුස්තකාලාධිපති තනතුරක , ආදායම් පරීක්ෂක තනතුරක, පෙර පාසැල් ගුරු තනතුරු දෙකක, වැඩ සුපරීක්ෂක තනතුරක , සෞඛ්‍ය සුපරීක්ෂක තනතුරක , යන්ත්‍ර ක්‍රියාකරු තනතුරක , වැඩ කම්කරු තනතුරක හා සෞඛ්‍ය කම්කරු තනතුරක පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනිමට කටයුතු කල යුතුය. | පුස්තකාලාධිපති තනතුර සඳහා බඳවා ගැනිමට පත්වීම් බලධාරියා වන බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට දන්වා ඇත. ආදායම් පරීක්ෂක තනතුරේ නඩුවත් පවතින බැවින් බඳවා ගැනීම් අත්හිටුවා ඇත. ඉතිරි තනතුරු සඳහා ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) අය නොවන සේවක ණය | | |
| 2020 ජුනි 30 දිනට මිය ගිය, විශ්‍රාම ගිය සේවකයින් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.78,507 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතුය. | ණය අයකර ගැනිමට අදාල කටයුතු සිදු කරමින් පවති. |

3.4 වත්කම් කළමණාකරණය

3.4.1 වත්කම් වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පොදු පහසුකම් සඳහා වෙන් කරනු ලැබූ ඉඩම් නිත්‍යානුකූලව මැන මායිම් වැටවල් ගසා පොදු කටයුතු සඳහා භාවිතා කර නොතිබීම හේතුවෙන් ඉඩම් කොටස් 04 ක් බාහිර පාර්ශවයන් අත්පත් කරගෙන තිබුණි. | සභාවට පොදු පහසුකම් යටතේ වෙන් කරනු ලැබූ ඉඩම් සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගැනීමට හා ආරක්ෂා කර ගැනීමට සභාව කටයුතු කල යුතුය. | සංවර්ධනය සඳහා සභාවට මූල්‍යමය හැකියාවක් නැති අතර ඉදිරියේදී මැන නිරවුල් කිරිමට කටයුතු කරමි. |

3.4.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පුද්ගලික සමාගමක් විසින් සභාවට එරෙහිව ගොනු කල නඩුවේ මුල් අවස්ථාවේදී වාසිදායක තීන්දුවක් ලැබී පසුව අදාල සමාගම විසින් කල අභියාචනයෙන් පසු සභාව විසින් අදාල නඩුව නොසලකා හැරීම තුලින් අවාසිදායක තීන්දුවක් ලැබීම නිසා එකී සමාගම වෙත වන්දි ලෙස රු.7,840,000 ක් ගෙවීමට සිදුවී තිබුණි. | සභා අරමුදලින් දරන ලද වියදම වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | මේ කරුණ සම්බන්ධව විමර්ශනයක් පළාත් පාලන කොමසාරිස් වෙතින් ඉල්ලා ලිපියක් යොමු කර ඇත. |

3.5 ප්‍රසම්පාදනය

කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මාර්ග කොන්ක්‍රීට් කිරීමේදී මාර්ගයේ ගුණත්වය තහවුරු කිරිම core පරික්ෂාවන් මගින් හෝ cube පරික්ෂාව මගින් සිදුකල හැකි වුවද , මෙම පරික්ෂාවන් දෙක වෙන වෙනම සිදුකිරීම නිසා ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් රු.131,189 ක් ගෙවීම් කර තිබුණි. | කොන්ක්‍රීට් මාර්ග ඉදි කිරීමේදී තත්ව පරික්ෂාවන් සඳහා core හා cube test දෙකම එකම නියැදියකින් විධිමත් පරිදි සිදු කල යුතුය. | දැනට එලෙස සිදු නොකරන අතර සියළු සාම්පල් ලබා ගැනීම තාක්ෂණ නිලධාරින්ගේ අධික්ෂණය යටතේ සිදු කරනු ලබයි. ඉදිරියේදී පරික්ෂාවන් මෙලෙස සිදු කිරිමට අපේක්ෂා කෙරේ. |